C
373
EDI

# නිර්ණායක මූලික පරීක්ෂණයක කාර්ය සාධන මට්ටම් දෙකක සාපේක්ෂ කාර්යක්ෂමතාව විමසීමකි.

චන්ද්‍රා ජේ. එදිරිසූරිය

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන
පීඨයේ අධ්‍යාපන ශාස්ත්‍රපති උපාධිය සම්බන්ධ
අවශ්‍යතා අර්ධ වශයෙන් පූරණය කිරීම සඳහා
ඉදිරිපත් කෙරෙන පර්යේෂණාත්මක නිබන්ධනයකි.

1987

නිබන්ධ උපදේශක:-

ආචාර්ය මොහොට්ටිගේ යූ. සේදර.

412015

UNIVERSITY OF PERADENIYA
23-8-1988
LIBRARY



## සාරාංශය

නිර්ණායක මූලික පරීක්ෂණවල සමත් ලකුණ ලෙස 80% හෝ 90% වැනි ඉහළ නිර්ණායකයක් පිහිටුවීම සාම්ප්‍රදායිකව සිදුවිය – (Brennen – 1975; Block – 1971; Gronland – 1971, 1973).

පිරික්සීමට ලක්වන සමූහයේ ප්‍රතිමාන ආශ්‍රයෙන් ප්‍රමාණවත් ලෙස චර්යා ක්ෂේත්‍රය සුවිශේෂීකරණය වූත්, සාධාරණවූත්, පහසුවෙන් හඳුනාගත හැකිවූත් කරණ මට්ටමක් ( Standard Performance ) සහිත නිර්ණායකයක් පිහිටුවා ගැනීමෙන්, නිර්ණායක මූලික අර්ථ නිරූපණ සමඟ සමූහ මූලික අර්ථ නිරූපණ ද යා කර ගැනීම මගින් පිරික්සෙන්නාගේ අධ්‍යයන කාර්යය සම්බන්ධ අර්ථවත් හා ප්‍රමාණවත් විස්තර සැපයිය හැකිබව ඇතැම් ලේඛකයන් පෙන්වා ඇත – ( Ebel – 1971; Gronland – 1973; Sedere – 1979).

මෙම අධ්‍යයනයෙන් උත්සාහ ගෙන ඇත්තේ සාම්ප්‍රදායිකව යොදා ගැනෙන 90% නිර්ණායකය මගින් ගනු ලබන තීරණ, ප්‍රමට මූලික මිණුම්හි ප්‍රතිෂ්ඨාපිත සමාන්තර මධ්‍යනයය හා මධ්‍යස්ථය නිර්ණායකය ලෙස යොදා ගැනීමෙන් ගනු ලබන තීරණ සමග සංසන්දනය කිරීමෙන් එම නිර්ණායකවල සාපේක්ෂ කාර්යක්ෂමතාව විමසීමය. මෙම පර්යේෂණය පහත සඳහන් සුවිශේෂ කල්පිත හතර වටා ගොඩ නැගිණ.

01. නිර්ණායක මූලික පරීක්ෂණවලදී සාම්ප්‍රදායිකව යොදා ගැනෙන 90% සාධනය හා බැඳි නිර්ණායක මට්ටම් අළලා පිරික්සෙන්නාගේ සමත් අසමත් බව පිළිබඳ ගැනෙන තීරණ හා පරීක්ෂණයක සමාන්තර මධ්‍යනයය පූර්ව නිශ්චිත නිර්ණායකය ලෙස යොදා ගෙන ඊට

එරෙහිව සමත් අසමත් බව පිළිබඳව ගනු ලබන තීරණ අතර වෙසෙසි වෙනසක් ඇති නොවන්නේය.

02. නිර්ණායක මූලික පරීක්ෂණවලදී සාම්ප්‍රදායිකව යොදා ගැනෙන 90% සාධනය හා බැඳි නිර්ණායක මට්ටම අළලා පිරික්සෙන්නාගේ සමත් අසමත් බව පිළිබඳව ගැනෙන තීරණ හා පරීක්ෂණයක මධ්‍යස්ථය පූර්ව නිශ්චිත නිර්ණායකය ලෙස යොදා ගෙන ඊට එරෙහිව සමත් අසමත් බව පිළිබඳව ගනු ලබන තීරණය අතර වෙසෙසි වෙනසක් ඇති නොවන්නේය.

03. නිර්ණායකය ලෙස 90% සාධන මට්ටම යොදා ගත් කල පරීක්ෂණ - ප්‍රති පරීක්ෂණ අතර පවත්නා සංගතතාව සමාන්තර මධ්‍යනයය හා මධ්‍යස්ථය යොදා ගත් කලද වෙසෙසි වෙනසක් පෙන්නුම් නොකරන්නේය.

04. නිර්ණායකය ලෙස 90% සාධන මට්ටම යොදා ගත් කල අනුගාමික උපදේශන අවස්ථා හරහා නිර්ණායක මූලික පරීක්ෂණ පෙන්නුම් කරන නිර්ණායක වලංගුතාව (හෝ තීරණය පිළිබඳ විශ්වසයතාව) මධ්‍යස්ථය හෝ සමාන්තර මධ්‍යනයය හෝ යොදා ගත් විට වෙසෙසි ලෙස වෙනසක් පෙන්නුම් නොකරන්නේය.

මෙම අධ්‍යයනය පහත සඳහන් දේ අනාවරණය කළේය.

01. සමාන්තර මධ්‍යනයය නිර්ණායකය කොට ගෙන සමත් අසමත් බව පිළිබඳ නිගමන ගැනීම හා මුලු ලකුණුවලින් 90% ක් ලැබීම හෝ අපේක්ෂණවලින් 90% ක් සමත්වීම හෝ නිර්ණායකය කොට ගැනීම අතර වෙසෙසි වූ පරායත්තතාවක් පවතී. මෙම නිගමනය පසු පරීක්ෂණ හා ප්‍රති පරීක්ෂණ අවස්ථා දෙකෙහිදීම තහවුරු වී ඇත. එහෙත් නිර්ණායකය ලෙස සමාන්තර මධ්‍යනයය යොදා ගැනීමේදී සමත් හා අසමත් වශයෙන් ගන්නා තීරණ හා මුලු ලකුණුවලින් 90% ක් යොදා ගැනීම අතර

සංගතතාව, නිර්ණායකය ලෙස අපේක්ෂණවලින් 90% ක් යොදා ගැනීමට වඩා වැඩි සංගතතාවක් දක්වයි.

02. මධ්‍යස්ථය නිර්ණායකය කොටගෙන සමත් අසමත් බව පිළිබඳ නිගමන ගැනීම හා මුලු ලකුණුවලින් 90% ක් ලැබීම හෝ අපේක්ෂණ-වලින් 90% ක් සමත්වීම හෝ නිර්ණායකය කොට ගැනීම අතර වෙසෙසිවු පරායත්තතාවක් පවතී. මෙම නිගමනය පසු හා ප්‍රති පරීක්ෂණ අවස්ථා දෙකෙහිදීම තහවුරු වන්නේය. එහෙත් නිර්ණායකය ලෙස මධ්‍යස්ථය යොදා ගැනීමේදී නිර්ණායකය ලෙස මුලු ලකුණුවලින් 90% ක් ලබා ගැනීම සමඟ, නිර්ණායකය ලෙස අපේක්ෂණ-වලින් 90% සමත්වීම යොදා ගැනීමට වඩා වැඩි සංගතතාවක් දක්වන්නේය.

03. නිර්ණායකයක් ලෙස සමාන්තර මධ්‍යන්‍යය හා මධ්‍යස්ථය යොදා ගත් කල සමත් අසමත් වශයෙන් ගැනෙන තීරණ අතර පවත්නා පසු හා ප්‍රති පරීක්ෂණ සංගතතාව නිර්ණායකය ලෙස මුලු ලකුණුවලින් 90% යොදා ගැනීම හෝ නිර්ණායකය ලෙස අපේක්ෂණවලින් 90% යොදා ගැනීමට හෝ වඩා ඉහළය. එහෙයින් නිර්ණායකය ලෙස සමාන්තර මධ්‍යන්‍යය හෝ මධ්‍යස්ථය යොදා ගැනීමේ නිර්ණායක වලංගුතාව කෙටි කාලීනවත් දිගුකාලීනවත් 90% හා බැඳි නිර්ණායක යොදා ගැනීමට වඩා වැඩි වලංගුතාවක් දක්වන්නේය.

04. අනුගාමී උපදේශන පියවර හරහා කෙටි කාලීන වශයෙන් මධ්‍යස්ථය හා සමාන්තර මධ්‍යන්‍යය යොදා ගැනීම, මුලු ලකුණුවලින් 90% හෝ අපේක්ෂණවලින් 90% හෝ නිර්ණායක ලෙස යොදා ගැනීමට වඩා වැඩි වලංගුතාවක් පෙන්වයි. එහෙත් ප්‍රති පරීක්ෂණ ලකුණු (දීර්ඝකාලීනව) අනුව අපේක්ෂණවලින් 90% යොදා ගැනීම හා මුලු ලකුණුවලින් 90% යොදා ගැනීම, මධ්‍යස්ථය හා සමාන්තර මධ්‍යන්‍යය නිර්ණායකය තර ගැනීමට වඩා වැඩි වලංගුතාවක් දක්වයි.